මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: (94)-011-2484500, (94)-011-2484600, (94)-011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: (94)-011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: BD/CBP/01/01/06 - 2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.12. 23

**අයවැය චක්‍රලේඛ අංක: 07/2020**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශවල ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**2021 වියදම් දැරීම සඳහා බලය දීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය**

**01. වියදම් දැරීම සඳහා අධිකාරී බලය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 (1) අනු ව්‍යවස්ථාවේ සහ 2020 දෙසැම්බර් 10 දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2020 අංක 07 දරන විසර්ජන පනතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව 2021 වර්ෂයට අදාළ වන වියදම් දැරීම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා විසින් වොරන්ට් බලපත්‍ර අත්සන් කර ඇත.

ඒ අනුව, ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළ යුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා - 2021 අංක 1 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය

(ආ) විශේෂ නීති සේවා සඳහා - 2021 අංක 1 දරන විශේෂ නීති අධිකාරී බලපත්‍රය

(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2021 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය

**02. රාජ්‍ය වියදම් කළමනාකරණය**

මුදල් රෙගුලාසි 127 අනුව සියළුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් විසින් තමා යටතේ වන ආයතනවල මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සම්බන්ධයෙන් මුදල් ඇමතිවරයාට වගකිව යුතු වේ.

එසේම 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 හි 05 ඡේදයේ 05.1 උප වගන්තියේ සහ 2021 වර්ෂයට අදාළ විස්තරාත්මක ඇස්තමේන්තුවලද අවධාරණය කර ඇති පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර දී ඇති පුනරාවර්තන හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාරණය කර ගැනීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්ගේ මෙන්ම ගණන් දීමේ නිලධාරීන්ගේ ද වගකීම බව තරයේ අවධාරණය කරමි.

**03. <u>වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2021</u>**

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 හි 03 හා 04 ඡේදවල දැක්වෙන පරිදි වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපයෝජනය වන ආකාරය ද සඳහන් කරමින් 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අදාළ පරිදි අනුමැතිය ලබා ගත යුතු ය. ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමේ දී වර්ෂයේ මුල් කාර්තුවේ සිට ම මිල දී ගැනීම් හා ගෙවීම් කිරීමට හැකිවන පරිදි කාර්යයන් සංවිධානය කර ගැනීමට අවධානය යොමු කළ යුතු ය. වර්ෂය අවසාන කාර්තුවේ දී ගෙවීම් කිරීමට සිදු වන පරිදි සැලසුම් සකස් කිරීම හේතුවෙන් ද්‍රවශීලතා අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වේ. ඒ හේතුවෙන් නොපියවන ලද බිල්පත් ලෙස සැලකිය යුතු වියදමක් ඊ ළඟ වර්ෂය වෙත විතැන් වේ. මෙම අහිතකර තත්ත්වය සම්බන්ධයෙන් රජයේ මුදල් පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව විසින් ද අවධාරණය කර ඇති බැවින් ජනවාරි මාසයේ සිටම ඒ ඒ වැය විෂය විස්තරය යටතේ වන වියදම් පියවීමට හැකි වන පරිදි සිය සැලසුම් සකස් කළ යුතු වේ.

**04. <u>2021 අයවැය යෝජනා</u>**

2021 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ඒ ඒ අයවැය යෝජනාව සම්බන්ධයෙන් වෙන වෙනම අදාළ ආයතන වෙත ඉතා ඉක්මණින් දැනුම් දෙනු ඇත. අයවැය යෝජනා නිසි පරිදි ක්‍රියාත්මක කිරීම කෙරෙහි රජයේ දැඩි අවධානය යොමු වී ඇති බැවින් අදාළ ආයතන විසින් වර්ෂය ආරම්භයේදීම ඒ සඳහා අවශ්‍ය පියවර ගත යුතු වේ.

**05. <u>බැඳීම් කළමනාකරණය</u>**

2021 වර්ෂය තුළ නව බැඳීම්වලට එළඹීමට පෙර 2020 වර්ෂයට අදාළ වූ ගෙවිය යුතු බිල්පත් පවතී නම් ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර ගෙවීම් නිරවුල් කළ යුතු ය. සෑම විටම බැඳීම් ඇති කර ගැනීමට පෙර ඒ සඳහා ප්‍රමාණවත් අයවැය ප්‍රතිපාදන පවතින බව තහවුරු කර ගත යුතු ය.

අයවැය ප්‍රතිපාදන රහිතව ඇති කර ගනු ලබන බැඳීම් සඳහා භාණ්ඩාගාරයේ වගකීමක් නොමැති බැවින් එවන් වියදම් සඳහා අදාළ නිලධාරීන් පෞද්ගලිකව වගකිව යුතු වේ.

**06. <u>අමතර ප්‍රතිපාදන ඉල්ලීම්</u>**

කොවිඩ් - 19 ව්‍යසනය හමුවේ ඇති වී තිබෙන අවිනිශ්චිත බව හා වාර්ෂිකව ස්වභාවික ව්‍යසනයන් හේතුවෙන් පැනනගින වියදම් සඳහා වෙන් කිරීමට සිදු වන ප්‍රතිපාදන ප්‍රමාණයන් සළකා බලන විට අයවැයෙන් ඔබවෙත වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයන්ට අමතරව ප්‍රතිපාදන ලබා දීම ඉතා අසීරු වනු ඇත. එබැවින් 2021 වර්ෂය තුල පැනනගින වියදම්, ලබා දී ඇති ප්‍රතිපාදන හොඳින් ප්‍රමුඛතා ගත කරමින් කළමනාකරණය කළ යුතු ය.

අත්‍යවශ්‍යම කරුණක් සඳහා පමණක් අමතර ප්‍රතිපාදන ඉල්ලීම් කරන්නේ නම් එම ඉල්ලීම් සෑම විටම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ නිර්දේශ සහිතව භාණ්ඩාගාරය වෙත යොමු කළ යුතු ය. ඒ අනුව, රාජ්‍ය අමාත්‍යාංශයක් සඳහා වන අමතර ප්‍රතිපාදන ඉල්ලීම් අදාළ කැබිනට් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ සහිතව එවිය යුතු වේ.

**07. <u>මු. රෙ. 66 මාරු කිරීම්</u>**

මුදල් රෙගුලාසි 66 හා 69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීමේදී පුනරාවර්තන වියදම් යටතේ වන වැය විෂයයන් අතර වන මාරු කිරීම් මුදල් රෙගුලාසි 66 (4) (ආ), 66 (5) (ආ), 68 (iii) (ආ) සහ 69 (3) (අ) හි වන සීමාවන්ට යටත්ව අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ/ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අනුමැතිය මත සිදු කළ යුතු ය. එසේ මාරු කරන ලද ප්‍රතිපාදන පිළිබඳ විස්තරාත්මක වාර්තා අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පෙර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත එවිය යුතු ය.

ඉහත සඳහන් කළ පරිදි මුදල් රෙගුලාසි 66 (4) (ආ), 66 (5) (ආ) සහ 68 (iii) (ආ) සහ 69 (3) (අ) යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරුන්/ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් වෙත බලය ලබා දී ඇති අවස්ථාවන් හිදී හැර අනෙකුත් සියලුම අවස්ථාවන් හිදී ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා වන ඉල්ලීම් අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට පෙර ITMIS පරිගණක පද්ධතිය හරහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අදාළ නිළධාරීන් වෙත යොමු කළ යුතු ය.

2020.12.31 දිනට පසුව මුදල් රෙගුලාසි 69 යටතේ ප්‍රතිපාදන මාරුකිරීම සිදුකළ හැක්කේ <u>ඒ වන විටත් ප්‍රතිපාදන ඉක්මවා ගෙවීම් කර ඇති අවස්ථාවලදී පමණක්</u> වන අතර මුදල් රෙගුලාසි 69 දක්වා ඇති පරිදි පූර්ව අධිකාරී බලය ලබා නොගැනීමට <u>සෑහෙන හේතු ඉදිරිපත් කර නොතිබේ නම්</u> එවැනි මාරු කිරීම් අනුමත නොකරන බවද අවධාරණය කරමි.

**08. <u>අත්තිකාරම් ගිණුම් කටයුතු</u>**

පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති සීමාවන් තුළ අත්තිකාරම් ගිණුම් කටයුතු පවත්වා ගත යුතු අතර උපරිම වියදම් සීමාව වැඩි කිරීම සඳහා අවසර නොලැබෙන බැවින් වරින් වර සමාලෝචනය කරමින් එම සීමාවන් තුළ ම වියදම් කළමනාකරණය කර ගත යුතු වේ.

**09. <u>පැහැදිලි කර ගැනීම</u>**

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම්.අනෝමා නන්දනී මහත්මිය (දුරකථන අංක 011-2484681) වෙතින් ලබාගත හැක.

**එස්.ආර්.ආටිගල**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : (i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති
(v). ලේකම්, මුදල් කොමිෂන් සභාව